මව්රට දෛනික පුවත්පත
2021 සැප්තැම්බර් 26

අද DAY

ගෙදර ඉඳන් ඇවිදින්න...

උනුරුවන්කන්ද

අහනු බලනු සකි මෙන්න කැගලු සිරි...

ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම කතාබහට ලක්වන සංචාරක පාරාදීසයක් වන සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කය ගැන මෑත කාලිනව වැඩි වැඩියෙන් කතාබහට ලක් වුණා. විවිධ හේතු පාරිසරික දේශපාලන, යන කරුණු හා එහි ප්‍රජාව අතර ඇතිවූ හාස්‍යජනක සිදුවීම් විවිධ ඖෂධ සොයාගැනීම්, අදෘශ්‍යමාන බලවේග සමඟ සම්බන්ධතා ඇති අයවලුන් නිසාවෙන්ද කැගල්ල මේ වන විට අප රටේ ඉතාමත් ප්‍රසිද්දයි. ඒ නිසාම ලිපිය ලියන මාගේද කැගල්ල වටා ඇති කතා බොහොමයක් ඇති නිසාම ඇවිදිමු ලංකා අපි අද කැගල්ලේ කලින් කල සංචාර මතක ඔබත් එක්ක බෙදාගන්න හිතුවා.

විටෙක කදු නායයෑම්, ගස් කොලන් කඩා වැටීම් භූමිකම්පා වලින්ද බැට කන කැගල්ල සොබා සෞන්දර්යෙන් පිරිපුන් ප්‍රදේශයක්. එක්තරා වකවානුවක ලංකාවේ දිගම නගරය ලෙසද අභිෂේක ගැනුනු කැගල්ල නගරය තාමත් මාගේද මතක ගොන්නක් සගවා ගෙන සිටියි. කෘෂිකාර්මික ආර්ථිකයක් ඇති කැගල්ල දේශීය රබර්, තේ, කෙසෙල්, එනසාල්, කෝපි සහ මහෝගනී වගාවන්ද සුලු වශයෙන් ගොවිතැන් කරගනද එහි මිනිසුන් ජීවත් වෙයි.

අව්‍යාජ ගැමි දිවි පෙවතකට උරුමකම් කියන කැගල්ල මිනිසුන් කුමණ සොබාවික විපත් සිදුවුවද කැගල්ල අත නොහැර යාමට හේතු වශයෙන් සොයා බැලූවිට පෙනී යන්නේ නම් එහි වටපිටාවෙහි ඇති සුන්දරත්වය නිසාවෙනි. දිය ඇලි ගංගා ඇළ දොල, වනාන්තර එක්ව බැඳී ඇති නිසාවෙන් කුමන භාදක ආවද ගැමියන් තම සොදුරු ගම් පියස අත හැර නොයයි.

කැගල්ලට ඒ නම ලැබුණු හැටිද ඉතාමත් සුන්දර කතාවකි. ක්‍රි. පූ. 3 වැනි සියවසේ ශ්‍රී ලංකාවේ රජකම් කළ වළගම්බා රජතුමා ද්‍රවිඩයන් සමඟ කළ සටනේදී පැරදී සපරගමු පළාතේ වන ලැහැබක වූ ගල්ලෙනක සැඟවී සිටි බව කිය වේ. මෙහි ගල් තලයක හිඳ ආහාර අනුභව කොට යළි ගමන් ආරම්භ කරන අතරතුරේ රජතුමාට බුලත් සැපීමට අවශ්‍යතාවයක් ඇති වී ඇත. එවිට බුලත් මඩිස්සලයේ ගිරය නොමැති බව දැනගත් රජතුමා එය "කැගල" මත අමතක වී පැමිණි බවක් පවසා

ලංකාවේ රොබින්හුඩ් යන විරුදාවලිය ලත් ඔහු උතුවන්කන්දේ සරදියෙල් ලෙස එකල ප්‍රරසිද්ද වී ඇත. එදා සුදු ජාතිකයන්ගෙන් ගමට රටට සිදුවූ හානිය දැක වික්සෝප වී සුද්දා සමග අරගල කර ඔවුන් අත තිබෙන දන ධාන්‍ය අහිංසක ගැමියන් හට ලබා දී ගම සුද්දාගෙන් ගලවා ගැනීමට සිහින දුටු තරණයා සැගව සිටි කන්දයි මේ උතුවන්කන්ද.

ඇත. පසුකලෙක මෙම ප්‍රදේශය "කෑගල්ල" ලෙස ජනවහරට එක්විය. කෑගල්ල යනු සබරගමුව පළාතේ දෙවැනි අග නගරයයි.

එහෙව් ඓතිහාසික පසුබිමක් ඇති කෑගල්ලේ හා ඒ අවට ඇති මේ තරම් සංචාරක ස්ථාන මොනවදැයි අපි ගිහින්ම බලමු.

උතුවන්කන්ද

ලංකාවේ රොබින්හුඩ් යන විරුදාවලිය ලත් ඔහු උතුවන්කන්දේ සරදියෙල් ලෙස එකල ප්‍රසිද්ධ වී ඇත. එදා සුදු ජාතිකයන්ගෙන් ගමට රටට සිදුවූ හානිය දැක වික්සෝප වී සුද්දා සමග අරගල කර ඔවුන් අත තිබෙන දන ධාන්‍ය අහිංසක ගැමියන් හට ලබා දී ගම සුද්දාගෙන් ගලවා ගැනීමට සිහින දුටු තරුණයා සැගව සිටි කන්දයි මේ උතුවන්කන්ද.

උතුවන්කන්ද මුහුදු මට්ටමේ ඉදන් අඩි 1410 උසකින් යුක්තයි. පැයකින් පමණ නැගල බහින්න පුලුවන් එච්චරම අමාරුයි නැති කන්දක්.

පහලින් ගුහාවක් තියෙනවා. උඩ නැග්ගහම වටපිට හොඳට දර්ශනය වෙනවා. එකල සරදියෙල් කඳු ගැටයට තියන ආසව නිසාම දිනපතා මේ කන්දට නැගලා තියනවා. ඒ නැගපු අවස්ථාවක තමයි සුද්දා බඩු ගේනවා දැකලා මංකොල්ලකාලා දුප්පත් අයට බෙදලා දෙන්නේ. පසුකාලීනව 1864 දී වෙඩි තියලා සුද්දා අතින් සරදියෙල් මියදුනද සරදියෙල්ට ආරක්ෂාව සපයපු ගල් කුලුණ තාමත් සරදියෙල් එනකම් බලන් ඉන්නවා. ඉහලට නැග ගත් විට මුලු ලොවම දෑසට පෙනෙන බවක් දැනෙයි. අපේ කමක්, අපේ හැඟීමක් මෙහි එහා මෙහා යන විට දැනේ. ඉතින් මේ ඓතිහාසික කන්ද තරණය කර සරදියෙල් විසු ගමද නරබා එන්න.

තෙලි ඇල්ල

නෙළුම්දෙණිය හන්දියෙන් ගලපිටමඩ මාර්ගයේ (7km) හෝ කෑගල්ල - අව්ස්සාවේල්ල මාර්ගයේ පිටදෙණියේ සිට තුංතොට දෙසට ඇති මාර්ගයේ (6km) ක් පැමිණ තුංතොට හන්දියෙන් තෙලි ඇල්ල මාර්ගයේ මෙම ස්ථානයට ළඟා විය හැකිය. මෙය නම් කෑගල්ලේ තිබෙන අප්‍රසිද්ධ දිය ඇල්ලක්. ගුරුගොඩඔයෙහි අතු ශාඛාවකින් නිර්මාණය වූ තෙලි ඇල්ල, දුරට පෙනෙන උස ඇල්ලක් නම් නොවේ. ඔය විශාල ගල් තලාවක් හරහා ගලා යන විට නිර්මාණය වූ සුන්දර පරිසර කලාපයකි. අනිකුත් දිය ඇලිවලට සේම මෙම ස්ථානයටද අතීත කතා පුවතක් ඇත.

වළගම්බා රජු හා සබැඳි පුරාවෘත්තය දැක්විය හැකිය. රජු හා බිසව තෙලි ඇල්ලෙහි ස්නානයට පැමිණීමට පුරුද්දක් කරගෙන සිටි බවත් එක් දිනක බිසවගේ අතින් රන් තලියක් මෙම ඇල්ලට වැටුණු බවත්, එම නිසා මෙම ප්‍රදේශය තාලි ඇල්ල,- තෙලි ඇල්ල ලෙස ව්‍යවහාර වූ බවත් සැලකේ. පෙණ බුබුළු නගමින් ඔහේ ගලා යන දිය දහර සැබැවින්ම ගතට සිසිලසකි. අවට පරිසරය නෙතට සැනසුමකි. කෑගල්ලේ ඇවිද යන ඔබට සිත්සේ ආරක්ෂිතව නාගත හැකි එකම ස්ථානය ලෙස තෙලි ඇල්ල හැඳින්විය හැකිය.

අසුපිනි ඇල්ල

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ග්‍රාම කොට්ඨාසයේ පිහිටලා තියන මෙම ඇල්ල නම් ඉතාමත් සුන්දර වුණත් ඇල්ල වටා අසුන්දර කතා අද බොහෝමයක් අසන්න තියන ඇල්ලක්.

උසින් අඩි 325 විතර වන මෙම දිය ඇල්ල කොටස් කිහිපයකින් සමන්විතයි. කෑගලු සංචාරයේදී ඔබ වඩාත්ම ආරක්ෂාකාරී විය යුතුම සංචාරක ස්ථානයක් ලෙස හැඳින්වුවාට වරදක් නැත. අහුපිනි ඇල්ල වසරකට වරක් මිනිස් ජීවිතයක් අපෙන් උදුරගන්නවා. කියලත් ගමේ අය අතර කතාවක් තියෙනවා. වසරකට සැරයක් මේ ඇල්ලෙ පල්ලෙහා තියෙන වලකින් රත්තරං පාට ආදෙක් මතු වෙනවලු. මේ ආදා මතු වෙන්නෙ නර බිල්ලා ගන්න කිට්ටු වෙන කාලෙක කියලා තමයි ගම්වැසියෝනම් කියන්නෙ ජනප්‍රවාද කතා කොහොම වුණත් සැබැවින්ම වසර අවසානයේදී එක් ජීවිතයක් හෝ මෙහි සැගවී යන බව සත්‍යක්.

ඒ හින්දාම බොහෝ සංචාරකයන් දිය නෑමට යොදා ගන්නෙ අහුපිනි ඇල්ලෙ ඉහලින්ම ඇති කොටසයි. මා ඔයද ආරම්භ වන්නෙ මේ අහුපිනි ඇල්ලෙනි. වලගම්බා රජතුමා රාජධානිය ඇතහැරලා පලායනකොට දිය ඇල්ලක් හමු වෙලා තියෙනවා. රජතුමා මෙම අශ්වයාගෙ පිටින් තමයි මෙම ඇල්ල තරණය කරලා තියෙන්නෙ. ඒක නිසා අස්සයා පැනපු ඇල්ල කියලා හදුන්වලා තියෙනවා. පසු කාලීනව අසුපැනි ඇල්ල, අසුපිනි ඇල්ල, අහුපිනි ඇල්ල වෙලා තියෙනවා.

ඉතාමත් සුන්දර වටපිටාවකින් යුක්ත අසුපිනි ඇල්ල ඔයාලා නැරඹිය යුතුම ස්ථානයක් වුණත් එහි පවුලේ අය සමඟ යනවා නම් දෙවරක් සිතා බලන්න.

කෑගල්ලේ තවත් මෙවැනි සංචාරක ස්ථාන රාශියක් තියෙනවා. ඒ ගැන අපි ඉදිරි සතියේදී තවත් තොරතුරු කියන්න බලාපොරොත්තු වෙනවා.

ඉඳුන්. එස්. දැරණියගල





කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ග්‍රාම කොට්ඨාසයේ පිහිටලා තියන මෙම ඇල්ල නම් ඉතාමත් සුන්දර වුණත් ඇල්ල වටා අසුන්දර කතා අද බොහෝමයක් අසන්න තියන ඇල්ලක්. උසින් අඩි 325 විතර වන මෙම දිය ඇල්ල කොටස් කිහිපයකින් සමන්විතයි. කෑගලු සංචාරයේදී ඔබ වඩාත්ම ආරක්ෂාකාරී විය යුතුම සංචාරක ස්ථානයක් ලෙස හැඳින්වුවාට වරදක් නැත. අහුපිනි ඇල්ල වසරකට වරක් මිනිස් ජීවිතයක් අපෙන් උදුරගන්නවා.